# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.07.02 පැය 2245 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/1323/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


### 01. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මීගමුව පොලිස් ස්ථානය.

වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදු කරගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව 2025.07.02 වන අද දින අළුයම් කාලයේ මීගමුව පොලිස් වසමේ ලයිට් මෝල හන්දිය ප්‍රදේශයේදී මීගමුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 337 මිලි ලීටර් 500 (බෝතල් 450) ක්, නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 5040 (බැරල් 28) ක්, ගෑස් සිලින්ඩර් 10 ක් සහ පෙරීමට යොදා ගන්නා උපකරණ සමඟ සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 27 සහ 28 යන වයස්වල පසුවන රංගල සහ පුත්තලම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මීගමුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

### 02. හදිසි ගින්නක් - මැදගම පොලිස් වසම.

2025.07.02 වන දින දහවල් කාලයේ මැදගම පොලිස් වසමේ තඹාන රක්ෂිත ප්‍රදේශයේ ගින්නක් හටගෙන ඇති බවට මැදගම පොලිසියට ලද පණිවිඩයක් මත වහාම ක්‍රියාත්මක වූ මැදගම පොලිසිය සහ ප්‍රදේශවාසීන්ගේ සහය ඇතිව ගින්න මැඩපවත්වා ඇත.

මෙම ගින්නෙන් රක්ෂිතයේ අක්කර 10 ක පමණ කොටසක් ගිනිගෙන විනාශ වී ඇත. ගින්න ඇති වීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර, ගින්නෙන් ජීවිත හානි කිසිවක් වාතර්ා වී නොමැත. මැදගම පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

### 03. මාරක රිය අනතුරක් - වත්තල පොලිස් වසම.

2025.07.02 වන අද දින අළුයම් කාලයේ වත්තල පොලිස් වසමේ හැඳල ඇලකන්ද මාගර්යේ ඇලකන්ද දෙස සිට හැඳල හංදිය දෙසට ධාවනය වූ ප්‍රයිමුවර් රථයක්, මාගර්ය හරහා ගමන් කල පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදු වී ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික කාන්තාව රාගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 78 ක් වූ ඇලකන්ද, වත්තල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය රාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ ප්‍රයිමුවර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. වත්තල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - මධ්‍යම අධිවේගී මාගර්යේ කුරුණෑගල අනුපාලක ස්ථානය.

2025.07.02 වන අද දින අළුයම් කාලයේ මධ්‍යම අධිවේගී මාගර්යේ මීරිගම දෙස සිට යග්ගපිටිය දෙසට යතුරුපැදි පටවාගත් ලොරි රථයක් ධාවනය වෙමින් තිබියදී එම දිසාවටම ඊට පිටුපසින් ධාවනය වූ බස් රථයක ඉදිරිපස ලොරි රථයේ පිටුපස ගැටීමෙන් අනතුරක් සිදු වී ඇත. අනතුරින් බස් රථයේ රියදුරු ඇතුලු එහි ගමන් කළ මගීන් 08 දෙනෙකු තුවාල ලබා කුරුණෑගල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු එක් මගියෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 52 ක් වූ ලියනගොඩ බේරුවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස් රථයේ මගීන් 23 ක් පමණ ගමන් කර ඇති අතර මොවුන් බේරුවල සිට කාත්තන්කුඩිය දක්වා චාරිකාවක් යන අවස්ථාවේදී මෙම අනතුරට ලක්ව ඇති බවට සිදුකළ විමශර්නයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මධ්‍යම අධිවේගී මාගර්යේ කුරුණෑගල අනුපාලක ස්ථානය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**